සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வட மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 60 S I |
|---|---|---|
| නම: ........................................ | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I | කාලය පැය තුනයි |

සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(01) මිනිසාගේ පැවැත්ම සමාජීය වශයෙන් දියුණු වන විට ඔහුගේ අවශ්‍යතා පුළුල් විය. මෙම ගැටළුවට විසඳුමක් ලෙස

i. වෙළඳාම ඇති විය
ii. බාටර් ක්‍රමය ආරම්භ විය
iii. තමන්ට වඩාත් හොඳින් නිපදවිය හැකි භාණ්ඩ නිෂ්පාදනය කිරීම
iv. අතිරික්තයක් බිහිවීම

(02) උපතේ සිට මරණය දක්වා මිනිසාට නොයෙකුත් භාණ්ඩ හා සේවා අවශ්‍ය වේ. මෙම අවශ්‍යතා හා වුවමනා සපුරාලනු ලබන්නේ ව්‍යාපාර විසිනි. ව්‍යාපාරයක් යනු,

i. මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ආශ්‍රිත ආර්ථික කටයුත්තක්
ii. විද්‍යුත් මාධ්‍ය හරහා ගනුදෙනු සිදු කිරීම
iii. භාණ්ඩ හා සේවා විකිණීම
iv. විකිණීම හා මිලදී ගැනීම.

(03) ව්‍යාපාර කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයක් ලෙස අනාගත ආයෝජකයෝ යන්න නිවැරදිව දක්වා ඇත්තේ,

i. ව්‍යාපාරයේ අයිතිකරුවන්ය
ii. ව්‍යාපාරයට අවශ්‍ය විවිධ දෑ සපයන්නෝ
iii. ණය හා උපදේශන සේවා සපයන ආයතන
iv. අනාගතයේදී ව්‍යාපාර වල ආයෝජනය කිරීමට අපේක්ෂිත පුද්ගලයින් හා ආයතන

(04) ව්‍යාපාරයෙන් පිටත ජීවත් වන ජනතාව ප්‍රජාව ලෙස සැලකේ. නිදසුන් ලෙස

i. සේවකයෝ ii. කළමනාකරුවෝ iii. ජන මාධ්‍යවේදීහු iv. තරඟකරුවෝ

(05) ව්‍යාපාර පරිසරය ලෙස සරලව හැඳින්විය හැක්කේ,

i. අභ්‍යන්තර පරිසරය
ii. බාහිර පරිසරය
iii. ව්‍යාපාර වලට බලපෑම් කරන විවිධ සාධක ක්‍රියාත්මක වන වටපිටාව
iv. ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වයට බලපාන අභ්‍යන්තර සාධක

(06) පහත දැක්වෙන පාර්ශව හා බලවේග කෙරෙහි අවධානය යොමු කරන්න.

• සේවකයෝ • අයිතිකරුවන් • ගෝලීය පරිසරය • කළමනාකරුවන් • තරඟකරුවෝ

| ව්‍යාපාර පරිසරය | පාර්ශව හා බලවේග |
|---|---|
| අභ්‍යන්තර | A : (.........................................) |
| බාහිර | B : (.........................................) |

නිවැරදිව අනුපිළිවෙට ගැළපූ විට,

i. A : සේවකයෝ B : ගෝලීය පරිසරය
ii. A : සේවකයෝ B : අයිතිකරුවෝ
iii. A : අයිතිකරුවෝ B : කළමනාකරුවෝ
iv. A : තරඟකරුවෝ B : කළමණාකරුවෝ

(07) තාක්ෂණික පරිසරය ශීඝ්‍රයෙන් වර්ධනයට හේතු වන්නේ,

i. ව්‍යාපාර කටයුතු හා පුද්ගල ජීවන රටාව
ii. නව සොයාගැනීම් හා නව නිර්මාණ
iii. පුද්ගල ජීවන රටාව හා පරිඝණක තාක්ෂණය
iv. පරිඝණක තාක්ෂණය හා ව්‍යාපාර කටයුතු

(08) පහත දැක්වෙන විදේශ මුදල් වර්ග භාවිතා කරන රටවල් නිවැරදිව අනුපිළිවෙලට ගැළපූ විට,

i. 1B, 2A, 3C ii. 1B, 2C, 3A iii. 1C,2B,3A iv. 1C, 2A, 3B

| විදේශ මුදල් වර්ගය | භාවිතා කරන රට |
|---|---|
| 1. පවුම | A : ඇමෙරිකාව |
| 2. ඩොලරය | B : ජපානය |
| 3. යෙන් | C : බ්‍රිතාන්‍ය |

(09) ව්‍යාපාරවලට අවශ්‍ය අරමුදල් යොදවමින් එහි අවදානම දරන පුද්ගලයෝ,

i. අයිතිකරුවන් ii. ව්‍යාපාරිකයන් iii. හිමිකරුවන් iv. ආයෝජකයන්

(10) පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාරයක් ලෙස,

i. සමූපකාර සමිති ii. රාජ්‍ය දෙපාර්තමේන්තුව iii. රාජ්‍ය සංස්ථා iv. රාජ්‍ය සමාගම්

(11) අරමුණු අනුව ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීමේදී පදනම් වන අරමුණු නිවැරදිව දක්වා ඇති ඇති පිළිතුර තෝරන්න.

i. ලාභ ලැබීමේ අරමුණ, සමාජ සුභසාධන අරමුණ ii. ලාභ ලැබීමේ අරමුණ , පාරිභෝගික තෘප්තිය

iii. පාරිභෝගික තෘප්තිය, සමාජ සුභසාධන අරමුණ iv. සමාජ සුභසාධන අරමුණ , භාණ්ඩ වල ගුණත්වය

(12) ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ බලධරයා වනුයේ,

i. අදාළ ප්‍රාදේශීය සභාවේ ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්වරයා ය

ii. අදාළ පළාත් සභාවේ ව්‍යාපාරනාම රෙජිස්ට්‍රාර්වරයාය

iii. අදාළ පළාත් සභාවේ ලියාපදිංචි නාම නියෝජිතයාය

iv. අදාළ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි නාම නියෝජිතයාය.

(13) ඒක පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කර කොපමණ කාලයක් ඇතුළත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතුද?

i. දින 07ක් ඇතුළත ii. දින 10ක් ඇතුළත iii. දින 14ක් ඇතුළත iv. දින 20ක් ඇතුළත

(14) ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචිය සඳහා අයදුම්පත ලබාගත යුත්තේ,

i. අදාළ පළාත් සභාවේ රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ii. ග්‍රාම නිලධාරි කාර්යාලයෙනි

iii. ප්‍රාදේශීය ව්‍යාපාර රෙජිස්ට්‍රාර් කාර්යාලයෙනි iv. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනි

(15) පහත මෘදුකාංග අතරින් ගිණුම්කරණ මෘදුකාංගයක් නොවන්නේ කුමක්ද?

i. Quick Book ii. MS Powerpoint iii. Saga iv. MY OB

(16) වත්කමක ලක්ෂණයක් නොවන්නේ,

i. අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවීම ii. ව්‍යාපාරයේ පාලනයට යටත් වීම

iii. වර්තමාන බැඳීමක් පැවතීම iv. අනාගතයේදී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම

(17) සදෙව්ගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය පහත පරිදි වේ.

| | | | | |
|---|---|---|---|---|
| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
| 500 000 | = | 375 000 | + | 125 0000 |

සදෙව් රු.5000 ක් වූ තම නිවසේ විදුලි බිල ව්‍යාපාරයේ මුදලින් පියවූ පසුව ගිණුම්කරණ සමීකරණය වන්නේ,

i. 495 000 = 370 000 + 125 000 ii. 500 000 = 375 000 + 125 000

iii. 495 000 = 375 000 + 120 000 iv. 500 000 = 370 000 + 130 000

(18) හිමිකම වැඩි වීම - 50 000
ණයහිමියෝ අඩු වීම - 50 000

ඉහත ද්විත්ව බලපෑමට අදාළ නිවැරදි ගණුදෙනුව වන්නේ

i. අයිතිකරු රු.50 000ක මුදලක් තම පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන යාම

ii. අයිතිකරු තම පෞද්ගලික මුදලින් රු.50 000 ක ණය හිමියන් පියවීම

iii. ණය හිමියන්ට රු.50 000 ක මුදලක් ගෙවීම

iv. රු.50 000 ක බඩු තොග ණයට ගැනීම

(19) ඉදුෂ තම ව්‍යාපාරයේ ප්‍රයෝජනයට උපකරණ මිලට ගැනීම නිවැරදිව දක්වා ඇති ද්විත්ව සටහන වන්නේ,

i. ගැනුම් ගිණුම - හර , මුදල් ගිණුම - බැර ii. ගැනිලි ගිණුම - හර , මුදල් ගිණුම - බැර

iii. තොග ගිණුම - හර , මුදල් ගිණුම - බැර iv. උපකරණ ගිණුම - හර , මුදල් ගිණුම - බැර

(20) ව්‍යාපාරයෙහි ඇති වත්කම්, වගකීම්, හිමිකම් , ආදායම්, වියදම් යන සංරචක ඇතුළත් කර සාදන ගිණුම් සියල්ලෙහිම එකතුව

i. ලෙජරය ලෙස හැඳින්වේ ii. සමීකරණය ලෙස හැඳින්වේ

iii. ජ'නලය ලෙස හැඳින්වේ iv. උපයෝගී පොත ලෙස හැඳින්වේ

(21) පහත X තීරුවේ ගිණුම් වර්ගයද, Y තීරුවේ ලෙජර් ගිණුමද දක්වා ඇත

| X | Y |
|---|---|
| 1. වත්කම් ගිණුම | A ණයහිමි ගිණුම |
| 2. වගකීම් ගිණුම | B ණයගැති ගිණුම |
| 3. ආදායම් ගිණුම | C බැංකු ණය පොලී ගිණුම |
| 4. වියදම් ගිණුම | D විකුණුම් ගිණුම |

X තීරුවේ සඳහන් ගිණුම් වර්ග Y තීරුවේ සඳහන් ලෙජර් ගිණුම් සමග අනුපිළිවෙලින් ගැළපූ විට,

i. ABDC ii. BADC iii. CADB iv. ADCB

(22) වැඩිවීම හර අඩුවීම බැර යන ද්විත්ව සටහන් මූලධර්මය නිරූපනය වන ගිණුම් වර්ගය වන්නේ

i. ප්‍රාග්ධන ගිණුම ii. ණයහිමි ගිණුම iii. ගැණුම් ගිණුම iv. බැංකු ණය ගිණුම

(23) යම් ගණුදෙනුවක් සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන් පහත දැක්වේ

ණයහිමි ගිණුම හර රු. 10 000 මුදල් ගිණුම බැර රු. 10 000

සිදුවී ඇති ගණුදෙනුව වන්නේ

i. රු.10 000 භාණ්ඩ තොග ණයට ගැනීම ii. ණය හිමියන්ට මුදලින් ගෙවීම රු.10 000 කි

iii. රු.10 000 භාණ්ඩ තොගයක් අත්පිට මුදලට ගැනීම iv. රු.10 000 වියදම් ගෙවීම

(24) පහත සඳහන් ගණුදෙනුව සටහන් කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

අයිතිකරු රු.5 000 ක මුදලක් තම පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම

i. ගැණුම් ගිණුම හර රු. 5 000 මුදල් ගිණුම බැර රු.5 000

ii. මුදල් ගිණුම හර රු.5 000 ගැනිලි ගිණුම බැර රු.5 000

iii. ගැනිලි ගිණුම හර රු.5 000 මුදල් ගිණුම බැර රු.5 000

iv. ගැනිලි ගිණුම හර රු.5 000 ගැණුම් ගිණුම බැර රු.5 000

(25) නිවැරදි පිළිතුර තෝරන්න.

| අංකය | ගිණුම් වර්ගය | වැඩි වීම | අඩු වීම |
|---|---|---|---|
| i. | විදුලි වියදම් ගිණුම | බැර | හර |
| ii. | විකුණුම් ගිණුම | බැර | හර |
| iii. | මෝටර් රථ ගිණුම | බැර | හර |
| iv. | පොලී ආදායම් ගිණුම | හර | බැර |

(26) X තීරුවේ මූලික සටහන් පොත දක්වා ඇති අතර Y තීරුවේ මූලාශ්‍ර ලේඛණය දක්වා ඇත.

| X | Y |
|---|---|
| 1. මුදල් ගිණුම | A ජ'නල් වවුචරය |
| 2. බැංකු ගිණුම | B විකුණුම් ඉන්වොයිසය |
| 3. විකුණුම් ජනලය | C ලදු පත |
| 4. පොදු ජ'නලය | D තැන්පත් කිරීමේ කුවිත්තාසිය |

X තීරුවේ සඳහන් මූලික සටහන් පොත් Y තීරුවේ මූලාශ්‍ර ලේඛණ සමග අනුපිළිවෙලට ගැළපූ විට,

i. CDBA ii. CDAB iii. ADCB iv. BADC

(27) ව්‍යාපාරයකට රු.300 000 වටිනා ලී බඩු උපකරණ ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා සමන් ෆර්නිචර්ස් වෙතින් ණයට ගැනීම සටහන් කිරීමට අදාළ මූලික සටහන් පොත වන්නේ

i. මුදල් පොත ii. විකුණුම් ඉන්වොයිසය iii. ගැණුම් ඉන්වොයිසය iv. පොදු ජ'නලය

(28) ගෙවල් කුලී වියදම් ගෙවීම සඳහා ව්‍යාපාරයක් නිකුත් කරන ලද රු.5 000 චෙක්පත අගරු වී ඇති බව බැංකුව දැනුම් දෙන ලදී. අගරු වීම සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන වන්නේ,

i. බැංකු ගිණුම හර රු.5 000 ගෙවල් කුලී වියදම් ගිණුම බැර රු.5 000

ii. ගෙවල් කුලී වියදම් ගිණුම හර රු.5 000 බැංකු ගිණුම බැර රු.5 000

iii. අගරු වූ චෙක්පත් ගිණුම හර රු.5 000 ගෙවල් කුලී වියදම් ගිණුම බැර රු.5 000

iv. ගෙවල් කුලී වියදම් ගිණුම හර රු.5 000 අගරු වූ චෙක්පත් ගිණුම බැර රු.5 000

(29) 2023.01.01 දිනට බාල පුත්‍රයාගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ පැවැති වාසිදායක ශේෂය රු.100 000 කි. ජනවාරි මාසය තුළ බැංකු ගිණුම ආශ්‍රිතව පහත ගණුදෙනු සිදුවී ඇත.

● 2023.01.05 රු.10 000 බැංකුවේ තැන්පත් කිරීම ● 2023.01.08 ණයගැතියන්ගෙන් අංක 100 දරණ රු.15 000 ක චෙක්පත ලැබීම ● 2023.01.10 විදුලි බිල් සඳහා රු.2 000 චෙක්පතක් නිකුත් කිරීම (චෙ.අ 75)

ව්‍යාපාරයේ 2023.01.31 දිනට බැංකු ගිණුමේ පැවති ශේෂය වන්නේ,

i. රු. 23 000 ii. රු. 125 000 iii. රු. 123 000 iv. රු. 112 000

(30) ලද වට්ටම් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ ,

i. ලද වට්ටම් වියදමක් වන අතර ලද වට්ටම් ගිණුමට හර කරයි
ii. ලද වට්ටම් ආදායමක් වන අතර ලද වට්ටම් ගිණුමට හර කරයි
iii. ලද වට්ටම් ආදායමක් වන අතර ලද වට්ටම් ගිණුමට බැර කරයි.
iv. ලද වට්ටම් ආදායමක් හෝ වියදමක් නොවන අතර මුදල් පොතේ සිහිවටන තීරුවල පමණක් පෙන්වයි

(31) මුදල් පොතේ හර පැත්තේ වට්ටම් තීරුවේ එකතුව

i. දුන් වට්ටම් ගිණුමට හර කරයි
ii. ලද වට්ටම් ගිණුමට හර කරයි
iii. දුන් වට්ටම් ගිණුමට බැර කරයි
iv. ලද වට්ටම් ගිණුමට බැර කරයි

(32) ව්‍යාපාරයක බැංකු ගිණුම තුලනය කිරීමේදී රු.12 000 ක බැර ශේෂයක් දක්නට ලැබුණි. එය ව්‍යාපාරයේ

i. වත්කමකි ii. වගකීමකි iii. ආදායමකි iv. වියදමකි

(33) දසිනි ට්‍රේඩ් සෙන්ටර්හි ප්‍රධාන මුදල් භාරකරු 2023.11.01 දින රු.2500ක් සුළු මුදල් භාරකරුට ලබා දුනි. 2023.02.01 දින සුළු මුදල් භාරකරු සතුව රු.370ක් ඉතිරිව තිබුණි. මෙහි මාසය තුළ සිදුව ඇති සුළු වියදම් වල වටිනාකම වන්නේ,

i. රු.2130 කි ii. රු.2870 කි iii. රු.2500 කි iv. රු.2370 කි

(34) ඉහත දසිනිගේ ව්‍යාපාරය 2023.12.01 දින සිට සුළු මුදල් අග්‍රිමය රු.3000 කිරීමට තීරණය කර ඇත්නම් අග්‍රිමය ප්‍රතිපූරණය කළ යුතු අගය වනුයේ,

i. රු.3000 කි ii. රු.2500කි iii. රු.870 කි iv. රු.2630 කි

(35) කිසියම් කාලච්ඡේදයක් අවසානයේ විකුණුම් ජනලයේ මුළු එකතුව විකුණුම් ගිණුමට① ...................... කරන අතර ඒ ඒ දිනට② ...................... ගිණුම්වලට හර කරනු ලබයි.

ඉහත①හා②හිස්තැන්වලට ගැලපෙන නිවැරදි පිළිතුර වන්නේ,

i. හර , ණයගැති ii. බැර , ණයගැති iii. බැර , ණයහිමි iv. හර , ණයහිමි

(36) පොදු ජනලයක සටහන් කරන ගනුදෙනු වර්ග අඩංගු පිළිතුර වනුයේ,

i. වෙළඳ භාණ්ඩ ණයට විකුණුම්
ii. වෙළඳ භාණ්ඩ ණයට ගැනුම්
iii. ස්ථාවර වත්කම් අත්පිට ගැණුම්
iv. වැරදි නිවැරදි කිරීමේ සටහන්

(37) පොදු ජනලයක සෑම ගනුදෙනුවකටම අදාළව තබනු ලබන කෙටි විස්තරය හඳුන්වනු ලබන්නේ,

i. සාරාංශය ලෙසය ii. ද්විත්ව සටහන ලෙසය iii. සංලක්ෂය ලෙසය iv. ජනල් සටහන් ලෙසය

(38) අංජන තනි පුද්ගල ව්‍යාපාරිකයෙකි. එම ව්‍යාපාරයේ 2023.12.31 දිනට බැංකු ජංගම ගිණුමේ හර ශේෂය රු.18 500ක් වූ අතර බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශයේ ශේෂය රු.25 000 ක් විය. මෙම වෙනසට හේතුවක් විය නොහැක්කේ.

i. මුදල් පොතේ සටහහන් නොවූ බැංකුවට සෘජුවම ලැබී තිබූ රු.6500 ක ලාභාංශය
ii. මුදල් පොතේ සටහහන් නොවූ ස්ථාවර නියෝග මත බැංකුව ගෙවන ලද රු.6500 ක රක්ෂණ වාරිකය
iii. තැම්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ රු.6500 ක චෙක්පත
iv. නිකුත් කළ එහෙත් බැංකුවට ඉදිරිපත් නොවූ රු.6500 ක චෙක්පත

(39) ශේෂ පිරික්සුමක ගනුදෙනු සටහන් කිරීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය

i. ශේෂ පිරික්සුමේ හර හා බැර එකතුව සමාන උවහොත් සෑම විටම ගිණුම් තැබීම නිවැරදි වේ
ii. ශේෂ පිරික්සුමක වත්කම් හා වියදම් ගිණුම් වල ශේෂ බැරට සටහන් කරයි
iii. ශේෂ පිරික්සුම සකස් කරන්නේ ගිණුම් කාලච්ඡේදයේ ආරම්භක දිනටය
iv. ශේෂ පිරික්සුමක වගකීම් හා ආදායම් ගිණුම්වල ශේෂ බැරට සටහන් කරය

(40) සත්සරණිගේ ව්‍යාපාරයේ රු.30 000ක බැංකු ණය පියවීමට අදාළව ගිණුම් තබා ඇත්තේ මුදල් පොත් පමණි. මෙම වරද නිවැරදි කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

i. බැංකු ණය ගිණුම හර අවිනිශ්චිත ගිණුම බැර
ii. අවිනිශ්චිත ගිණුම හර බැංකු ණය ගිණුම බැර
iii. බැංකු ණය ගිණුම හර මුදල් පොත බැර
iv. මුදල් පොත හර බැංකු ණය ගිණුම බැර

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**10 ශ්‍රේණිය** **වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024)** **60 S II**

නම: ............................................ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II **කාලය තුනයි එකයි**

පළමු ප්‍රශ්නයටත්, I කොටසින් ප්‍රශ්න දෙකක්ද II කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

(01) පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

නගරයේ පාසලක් ආසන්නයේ "නදූ බුක් ෂොප්" නමින් ලිපිද්‍රව්‍ය හා පාසල් උපකරණ අලෙවිකිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන නඳුන් අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකි. රු.20 000/= ක මාසික වැටුපකට රුහන්සා නැමති සේවිකාවක්ද යොදවා ඔහු මෙම ව්‍යාපාරය පවත්වාගෙන යයි. 2023.01.01 දිනට ඔහුගේ ගිණුම් පොත් වල පහත සඳහන් ශේෂ පැවතුණි.

| | |
|---|---|
| ගොඩනැගිලි | රු. 800 000 |
| තොගය | රු. 300 000 |
| මුදල් | රු. 200 000 |
| බැංකු ණය | රු. 500 000 |
| උපකරණ | රු. 150 000 |
| බැංකු මුදල් | රු. 400 000 |

නඳුන්ගේ ව්‍යාපාරයේ ජනවාරි මාසයේ පහත ගණුදෙනු සිදුවී ඇත.

- භාණ්ඩ මිලදී ගැනීම රු.25 000/=
- අත්පිට විකුණුම් රු.100 000/=
- භාණ්ඩ ණයට ගැණුම් රු. 20 000/=
- ගොඩනැගිලි කුලී රු. 16 000/=
- ණයට විකුණුම් රු. 30 000/=
- සේවක වැටුප් චෙක්පතකින් ගෙවීම රු.20 000/=
- දුරකථන බිල රු. 2000/=
- විදුලි බිල චෙක්පතකින් ගෙවීම රු.3500/=
- මුදල් ගැනිලි රු. 8000/=
- ණයගැතියන්ගෙන් චෙක්පතක් ලැබුණා රු.15000/=

(මෙම චෙක්පත එදිනම බැංකුවේ තැන්පත් කරන ලදී)

ඉදිරියේදී ව්‍යාපාරයට නඳුන්ගේ සොයුරා සකිඳු ප්‍රාග්ධනය යොදවමින් සම්බන්ධ වීමට බලාපොරොත්තුවෙන් සිටියි.

(I) (අ) මෙම ව්‍යාපාර සංවිධානයේ දක්නට ලැබෙන නිෂ්පාදන සාධක 02ක් ලියා දක්වන්න
(ආ) "නදූ බුක් ෂොප්" හි ශක්තියක් හා අවස්ථාවක් ලියා දක්වන්න. (ල.02)

(II) (අ) මෙහි දක්නට ලැබෙන අභ්‍යන්තර පරිසර සාධක මොනවාද?
(ආ) ඇල්මැති පාර්ශවයක් ලෙස රුහන්සා ව්‍යාපාරයෙන් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු 02 ක් ලියන්න. (ල.02)

(III) (අ) හිමිකාරිත්වය අනුව "නදූ බුක් ෂොප්" කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත්ද?
(ආ) එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසියක් හා අවාසියක් ලියා දක්වන්න (ල.02)

(IV) (අ) ඉදිරියේදී සකිඳු ව්‍යාපාරය හා සම්බන්ධ වීමේදී "නදූ බුක් ෂොප්" කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයක් බවට පරිවර්තනය විය යුතුද?
(ආ) එම නව ව්‍යාපාරයේ උපරිම අවම සාමාජික සංඛ්‍යාව දක්වා ඇති පනත කුමක්ද? (ල.02)

(V) (අ) 2023/01/01 දිනට මෙම ව්‍යාපාරයේ හිමිකම කොපමණද?
(ආ) 2023/01/01 දිනට ගිණුම්කරණ සමීකරණය ලියා දක්වන්න (ල.02)

(VI) (අ) මෙම ව්‍යාපාරයේ ජනවාරි මාසයේ මුළු ගැනුම් වටිනාකම දක්වන්න
(ආ) මෙම ව්‍යාපාරයේ ජනවාරි මාසයේ මුළු විකුණුම් වටිනාකම දක්වන්න (ල.02)

(VII) (අ) මෙම ව්‍යාපාරයේ වගකීම් 02ක් ලියා දක්වන්න
(ආ) මෙහි චෙක් පතකින් ණයගැතියන්ගෙන් මුදල් ලැබීමට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න (ල.02)

(VIIII)(අ) 2023/01/31 දිනට මෙහි බැංකු ශේෂය ගණනය කොට දක්වන්න

(ආ) මුදල් ගැනිලි වලට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න (ල.02)

(IX) බැංකු ප්‍රකාශය ලැබීමෙන් පසු බැංකු ගිණුම සම්බන්ධව පහත තොරතුරු අනාවරණය විය.

ස්ථාවර නියෝග මත ගෙවූ රක්ෂණ ගාස්තු රු.5500/=

බැංකු ගාස්තු රු.1000/=

ණයගැති ප්‍රේෂණ රු.8000/=

ඉහත තොරතුරු අනුව ජනවාරි මාසය සඳහා සංශෝධිත බැංකු ගිණුම පිළියෙල කරන්න. (ල.02)

(X) 2023/01/31 දිනට මුදල් ශේෂය ගණනය කරන්න (ල.02)

(02) මිනිසාට නොයෙකුත් භාණ්ඩ හා සේවා ජීවත් වීම සඳහා අවශ්‍යය වේ. මෙම අවශ්‍යතා හා වුවමනා සපුරාලනු ලබන්නේ ව්‍යාපාර විසිනි.

(I) (අ) ව්‍යාපාරයක් යනු කුමක්ද යන්න නිර්වචනය කරන්න

(ආ) බොහෝ ව්‍යාපාර කටයුතු කරන්නේ කුමන අපේක්ෂාවෙන්ද? (ල.02)

(II) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න

(අ) සමාජ සුභසාධන අපේක්ෂාවෙන් කටයුතු කරන ව්‍යාපාර ද ඇත. (.........)

(ආ) පෞද්ගලික අංශයේ ව්‍යාපාර සමාජ සුභසාධන අරමුණක් නැත (.........)

(ඉ) පාරිභෝගිකයෙකු ලෙස ඔබේ අරමුණ උසස් නිෂ්පාදිත සාධාරණ මිලකට ලබා ගැනීම(.........)

(ඊ) භාණ්ඩ හුවමාරු ක්‍රමය සඳහා මුදල් යොදා ගන්නා ලදී (.........) (1/2 x 4 = ල.2)

(III) වෘත්තීය මැහුම් පාඨමාලාවක් හදාරා ඇති වෙනුකි කුඩා ළමුන් සඳහා විවිධ වර්ගයේ නිමි ඇඳුම් නිෂ්පාදනය කර අන්තර්ජාලය හරහා අලෙවි කරයි. (Online) ඇයගේ අනාගත අරමුණ නිමි ඇඳුම් ආයතනයක් තම ප්‍රදේශයේ ආරම්භ කිරීමයි

(අ) ඉහත ව්‍යාපාරයේ ව්‍යාපාර අරමුණක් ලියන්න

(ආ) මෙම අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය උප අරමුණක් ලියන්න (ල.02)

(IV) ජීවත් වීම සඳහා මිනිසා අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු දෑ අවශ්‍යතා වේ.

(අ) මූලික මිනිස් අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න.

(ආ) අවශ්‍යතා වල ලක්ෂණ දෙකක් සඳහන් කරන්න (ල.02)

(03) අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ආකාර උවමනා වේ.

(I) (අ) වුවමනා වල දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න

(ආ) අවශ්‍යතා සපුරා ගන්නා එක් ආකාරය බැගින් පහත වගුව භාවිතා කරමින් ලියන්න. (ල.02)

| අවශ්‍යතාව | වුවමනාව (සපුරා ගන්නා ආකාරය) |
|---|---|
| ප්‍රවාහනය | a. (......................................) |
| සෞඛ්‍යය | b. (......................................) |

(II) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍ය ද යන්න දක්වන්න

(අ) මූල්‍ය ආයතන ව්‍යාපාර කෙරෙහි උනන්දු නොවේ (..........)

(ආ) කය වෙහෙසා වැඩ කරන පුද්ගලයෝ කළමනාකරුවෝ වෙති (..........)

(ඉ) තරඟකරුවෝ ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයට අයත් වේ (..........)

(ඊ) අයවැය ප්‍රතිපත්තිය දේශපාලන පරිසරයට නිදසුනකි (..........) (ල.02)

IIII)(අ) නව සොයාගැනීම් හා නව නිර්මාණ ආදිය නිසා තාක්ෂණික පරිසරය ශීඝ්‍රයෙන් වෙනස් වේ. තාක්ෂණික පරිසරයේ වෙනස් වීම් ව්‍යාපාරවලට බලපෑ එක් ආකාරයක් සඳහන් කරන්න.

(ආ) ආර්ථික පරිසරය යනු කුමක්ද? (ල.02)

(IV) ගෝලීය පරිසරයේ ඇති විවිධ සාධකවල වෙනස්වීම් දේශීය ව්‍යාපාර වලටද හිතකර හා අහිතකර ලෙස බලපායි.

(අ) දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑමක් සඳහන් කරන්න.

(ආ) ගෝලීය පරිසරයෙන් දේශීය ව්‍යාපාරවලට සිදුවන අහිතකර බලපෑමක් ලියන්න. (ල.02)

## II කොටස

(04) (I) ව්‍යාපාර සංවිධාන පරිමාණය අනුව වර්ග කිරීමේදී විවිධ නිර්ණායක සළකා බලනු ඇත. එසේ සලකා බලනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායක 04 ක් ලියන්න. (ල.02)

(II) කවිඳු පෙරේරා අ.පො.ස (උ.පෙළ) විභාගය අවසන්ව "කවිඳු ෆැෂන්" නමින් රෙදිපිළි අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යයි. පසුව ඔහු තම මිතුරෙකු වූ නවිඳු ද සම්බන්ධ කරගෙන "Kand N ෆැෂන්" නමින් නව මුහුණුවරයක් යටතේ රෙදිපිළි අලෙවි කිරීමේ ව්‍යාපාරය පවත්වාගෙන යයි.

(අ) "කවිඳු ෆැෂන්" ව්‍යාපාරය ලියාපදිංචි කල යුතුද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) "කවිඳු ෆැෂන්" ව්‍යාපාරයට සාපේක්ෂව "Kand N ෆැෂන්" ව්‍යාපාරයේ දැකිය හැකි වාසි 02ක් සඳහන් කරන්න. (ල.02)

(III) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) විශේෂ හෝ පවත්නා පොදු පාර්ලිමේන්තු පනතක් මගින් ආරම්භ කරන ව්‍යාපාර සංවිධාන රාජ්‍ය සංස්ථා වේ (..........)

(ආ) සමුපකාර සමිතියක් ආරම්භ කිරීම සඳහා අවම සාමාජික සංඛ්‍යාව 10කි. (..........)

(ඉ) රාජ්‍ය දෙපාර්තමේන්තු සඳහා නෛතික පුද්ගලභාවයක් ඇත (..........)

(ඊ) හවුල් ව්‍යාපාර 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ යුතුය. (..........)

(ල.02)

(IV) (අ) අනෙකුත් ව්‍යාපාර සංවිධානවලට සාපේක්ෂව සමුපකාර සමිතිවල දැකිය හැකි ලක්ෂණ 02ක් සඳහන් කරන්න.

(ආ) පහත සඳහන් ව්‍යාපාර අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න.

1. ජයරත්න ස්ටෝර්ස්
2. විදේශ සේවා නියුක්ති කාර්යංශය (ල.02)

(05) (I) පහත සඳහන් අයිතම වත්කම්, වගකීම්, වියදම් , ආදායම් හා හිමිකම් ලෙස වර්ග කර දක්වන්න

(අ) ස්ථාවර තැන්පතු -
(ආ) ණයගැතියෝ -
(ඉ) රක්ෂණය -
(ඊ) විකුණුම් ආදායම - (ල. 02)

(II) ප්‍රියංකා විසින් ආරම්භ කර පවත්වාගෙන යන ව්‍යාපාරයක 2023 ජනවාරි මාසයේ මුල් සතියට අදාල ගනුදෙනු පහත දැක්වේ.

i. රු.300 000 බැංකු ණය ලබා ගැනීම
ii. රු.50 000 වටිනා ලී බඩු උපකරණ මිලදී ගැනීම
iii. රු.10 000 වටිනා භාණ්ඩ තොගයක් ණයට ගැනීම
iv. රු.25 000 ණයහිමියන්ට ගෙවීම

ප්‍රියංකා විසින් ආරම්භ කළ ව්‍යාපාරයේ ජනවාරි මුල් සතියේ සිදුවූ ගනුදෙනු පහත සමීකරණයට ගලපන්න.

| ගනුදෙනුව | ලී බඩු උපකරණ | + තොගය | + මුදල් | = හිමිකම | + බැංකු ණය | + ණයහිමියෝ |
|---|---|---|---|---|---|---|
| i<br>ii<br>iii<br>iv | | | | | | |

(ල. 02)

(III) (අ) පහත සඳහන් ගනුදෙනුව සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න.
රු. 100 000 වටිනා ලී බඩු උපකරණ මිලදී ගැනීම (ල.02)

(ආ) මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් සටහන් කිරීමට අදාල මූලික සටහන් පොත හා මූලාශ්‍ර ලේඛණ සඳහන් කරන්න. (ල.02)

(IV) 2023.01.01 දිනට පුන්සරගේ ව්‍යාපාරයේ ජනවාරි මාසයේ මුල් සතියට අදාල ගනුදෙනු පහත දැක්වේ.

| දිනය | ගණුදෙනුව |
|---|---|
| 2023.01.01 | රු. 300 000 ප්‍රාග්ධනය යෙදීම |
| 2023.01.02 | රු. 2 000 විදුලි වියදම ගෙවීම |
| 2023.01.04 | බැංකු ණය ආපසු ගෙවීම රු. 10 000 කි |
| 2023.01.05 | කුලී ආදායම ලැබීම රු.15 000 කි |

ඉහත සඳහන් ගනුදෙනු ගිණුම්ගත කර පෙන්වන්න. (ල. 04)



(8) WWW.PastPapers.WiKi (7)
Download Term Test Papers, Short Notes From One Place!

(06) (I) පොදු ජ'නලයක සටහන් කරන ගනුදෙනු දෙකක් ලියන්න. (ල.2)

(II) බැංකු අයිරාවක් යනු කුමක්ද? (ල.2)

(III) නිසධිගේ ව්‍යාපාරයේ 2023.04.01 දිනට මුදල් පොතේ හර ශේෂය රු.75 000 ක් විය. අප්‍රේල් මාසයේ නිසධිගේ ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදුවිය.

2023.04.05 ල.අ 10 ණයගැති මල්මිගෙන් රු.25 000 ක මුදලක් ලැබීමේදී රු.5000 ක වට්ටමක් දෙන ලදී
2023.04.09 ව.අ 41 ණයහිමි ලිමංසාට රු.30,000 ක් ගෙවීමේදී අඩුකළ වට්ටම 5% කි
2023.04.12 ල.අ 11 ණයගැති දිව්‍යාගෙන් රු.20000ක් ලැබීමේදී අඩුකළ වට්ටම 10% කි
2023.04.18 ව.අ 60 ණයහිමි දිනිතිට ගෙවූ මුදල රු.18 500 කි. අඩුකළ වට්ටම රු. 1500කි

අවශ්‍ය වන්නේ,
වට්ටම් තීරු සහිත මුදල් පොත පිළියෙල කර තුලනය කිරීම (ල.4)

(IV) අමිත් ටෙක්ස් හි 2023 සැප්තැම්බර් මාසය සඳහා ලැබුණු සුළු මුදල් අග්‍රිමය රු.4000කි. 2023 සැප්තැම්බර් මාසයේ සුළු මුදල් ගෙවීම් පහත දැක්වේ.

| දිනය | ව.අ | විස්තරය | වටිනාකම (රු) |
|---|---|---|---|
| 2023.09.05 | 11 | තැපැල් වියදම | 500 |
| 2023.09.15 | 12 | ගමන් වියදම | 500 |
| 2023.09.18 | 13 | අත්තිකාරම් - රංග | 1500 |
| 2023.09.27 | 14 | ගමන් වියදම් | 750 |

අවශ්‍ය වන්නේ,
ඉහත ගනුදෙනු සුළු මුදල් පොතක සටහන් කර 2023.09.30 දිනට තුලනය කිරීම (ල.4)

(07) (I) ව්‍යාපාරයක බැංකු ගිණුමට හර කරන ගනුදෙනු දෙකක් ලියන්න. (ල.2)

(II) ගිණුම්කරණ වැරදි ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. ඉන් ශේෂ පිරික්සුමේ සමානත්වයට බලනොපාන වැරදි වර්ග දෙකක් ලියන්න (ල.2)

(III) ණයගැතියෙකුගෙන් ලද බැංකුවේ තැන්පත් කළ රු.75 000ක චෙක් පතක් අගරු වීම සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න. (ල.2)

(IV) රුක්ශාන්ගේ ව්‍යාපාරයේ 2023 ඔක්තෝබර් මාසයේ ණයට ගැනුම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2023.10.01 ඉ.අ 20 පුබුදුගෙන් රු.25 000ක භාණ්ඩ ණයට ගන්නා ලදී
2023.10.12 ඉ.අ 21 අමිත්ගෙන් රු.50 000 ක භාණ්ඩ ණයට ගන්නා ලදී
2023.10.15 ඉ.අ 22 සුමිත්ගෙන් රු.100 000ක භාණ්ඩ ණයට ගැනීමේදී අඩුකළ වෙළඳ වට්ටම 10% කි

අවශ්‍ය වන්නේ

I 2023 ඔක්තෝබර් මාසයේ ගැනුම් ජ'නලය පිළියෙල කිරීම (ල.4)

II එම ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම (ල.2)

PAST PAPERS WIKI


(8) WwW.PastPapers.WiKi (8)
Download Term Test Papers, Short Notes From One Place!

## පිළිතුරු - I

| | | | |
|---|---|---|---|
| 01) | iii | 21) | ii |
| 02) | i | 22) | iii |
| 03) | iv | 23) | ii |
| 04) | iii | 24) | ii |
| 05) | iii | 25) | ii |
| 06) | i | 26) | i |
| 07) | ii | 27) | iv |
| 08) | iv | 28) | i |
| 09) | iii | 29) | iii |
| 10) | i | 30) | iii |
| 11) | i | 31) | i |
| 12) | ii | 32) | ii |
| 13) | iii | 33) | i |
| 14) | iv | 34) | iv |
| 15) | ii | 35) | ii |
| 16) | iii | 36) | iv |
| 17) | i | 37) | iii |
| 18) | ii | 38) | iii |
| 19) | iv | 39) | iv |
| 20) | i | 40) | i |

## පිළිතුරු - I

01) I අ) ශ්‍රමය - රුහන්සා
ප්‍රාග්ධනය - තොගය, මුදල් , ගොඩනැගිලි, උපකරණ, බැංකු මුදල්
ව්‍යාවසාය - නදුන් (ල.01)

ආ) ශක්තිය - අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව, ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් යොදවා තිබීම
අවස්ථාව - නගරයේ පාසල ආසන්නයේ ව්‍යාපෘති පිහිටා තිබීම (ල.01)

II අ) අයිතිකරු (නදුන්), සේවකයා (රුහන්සා)
ආ) සාධාරණ වැටුප් ලබා ගැනීම, රැකියා සුරක්ෂිත බව (ල.02)

III අ) තනි පුද්ගල ව්‍යාපාර (ල.01)
ආ) වාසි -
පහසුවෙන් ඇරඹිය හැකි වීම
සියලුම ලාභ අයිතිකරු සතු වීම
තොරතුරු වල රහස්‍ය බව ආරක්ෂා වීම
තීරණ ගැනීමේ ස්වාධීන බව
දක්ෂතා උපරිමව යෙදිය හැකි වීම

අවාසි -
වගකීම අසීමිත වීම
ප්‍රාග්ධනය රැස්කර ගැනීමේ දුෂ්කරතා
අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
තනි තීරණ අසාර්ථක වියහැකි වීම
නෛතික පුද්ගල භාවයක් නොමැති වීම (ල.02)

IV අ) හවුල් ව්‍යාපාර
ආ) 2007 අංක 07 දරන සමාගම් පනත (ල.2)

V අ) වත්කම්

| | |
|---|---|
| ගොඩනැගිලි | 800 000 |
| තොගය | 300 000 |
| මුදල් | 200 000 |
| උපකරණ | 150 000 |
| බැංකු මුදල් | 400 000 |
| | 1,850 000 |
| වගකීම් බැංකු ණය | (500 000) |
| හිමිකම | 1,350 000 |

(ල.01)

ආ) වත්කම් = හිමිකම් + වගකීම්

1850 000 = 1350 000 + 500 000 (ල.01)

VI අ) ගැනුම් ශේෂය

| | |
|---|---|
| මුදල් | 25 000 |
| ණය හිමියෝ | 20 000 |
| | 45 000 |

(ල.01)

ආ) විකුණුම් ශේෂය

| | |
|---|---|
| මුදල් | 100 000 |
| ණයගැතියෝ | 30 000 |
| | 130 000 |

(ල.01)

VII අ) බැංකු ණය, ණය හිමියෝ (ල.01)

ආ) බැංකු ගිණුම හර 15 000

ණය ගැතියෝ බැර 15 000 (ල.01)

VIII අ) බැංකු ගිණුම

| | | | | |
|---|---|---|---|---|
| 2023 1/1 | ඉ /ගෙ/ශේෂය | 400 000 | සේවක වැටුප් | 20 000 |
| | ණයගැතියෝ | 15 000 | විදුලි බිල | 3 500 |
| | | | 3/31ප/ගෙ ශේෂය | 391 500 |
| | | 415 000 | | 415 000 |
| 2/1 | ඉ/ශේෂය | 391 500 | | |

ශේෂය නිවැරදිව ගණනය කොට ඇත්නම් ලකුණු ලබා දෙන්න (ල.01)

ආ) ගැනිලි ගිණුම හර 8000

මුදල් ගිණුම බැර 8000 (ල.01)

IX

සංශෝධිත බැංකු ගිණුම

| | | | |
|---|---|---|---|
| 2/1ඉ/ශේෂය | 391 500 | රක්ෂණ ගාස්තු ස්/නි | 5 500 (1/2) |
| ණයගැති (ප්‍රේෂණ) | 8 000 (1/2) | බැංකු ගාස්තු | 1 000 (1/2) |
| | | ප/ගෙ ශේෂය | 393 000 (1/2) |
| | 399 500 | | 399 500 |
| ඉ/ගෙ ශේෂය | 393 000 | | |

(ල.02)

මුදල් ගිණුම

| | | | | |
|---|---|---|---|---|
| 1/1ඉ/ශේෂය | 200 000 | ගැනුම් | 25 000 | } 1/2 |
| විකුණුම් | 100 000 1/2 | ගොඩැනැගිලි කුලී | 16 000 | |
| | | දුරකථන | 2 000 | } 1/2 |
| | | ගැනිලි | 8 000 | |
| | | 1/31/ප/ගෙ ශේෂය | 249 000 | 1/2 |
| | 300 000 | | 300 000 | |
| 2/1 ඉ/ශේෂය | 249 000 | | | |

(ල.02)

ශේෂය නිවැරදිව ගණනය කොට ඇත්නම් ලකුණු ලබා දෙන්න.

02) I. අ) මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විවිධ වූ භාණ්ඩ හා සේවා නිශ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි.
ආ) ලාභ ඉපයීමේ අපේක්ෂාවෙන්

II. අ) සත්‍ය ආ) අසත්‍ය ඉ) සත්‍ය ඊ) අසත්‍ය
III. අ) ලාභ ඉපයීම පාරිභෝගික තෘප්තිය ඉහල යෑම.
ආ) භාණ්ඩ වල ගුණත්වය ඉහළ නැංවීම
රැකියා උත්පාදනය
සේවක සුභසාධනය
IV. අ) ආහාර ඇදුම් නිවාස
ආ) අත්‍යවශ්‍ය වීම පොදු වීම
නිර්මාණය කළ නොහැකි වීම සීමිත වීම
03) I. අ) අත්‍යවශ්‍ය නොවීම , විවිධ වීම , නිර්මාණය කළ හැකි වීම , සංකීර්ණ වීම , අසීමිත වීම
ආ) a. පෞද්ගලික ප්‍රවාහනය, පොදු ප්‍රවාහනය.
II (අ) සත්‍ය (ආ) අසත්‍ය (ඉ) අසත්‍ය (ඊ) සත්‍ය
b. රජයේ රෝහල්, පෞද්ගලික රෝහල්, වෛද්‍ය සායන (සුදුසු පිළිතුර සලකා බලන්න) (ල.02)
III. අ) සරල අත්යන්ත්‍ර භාවිතා කර රෙදි නිෂ්පාදනය වෙනුවට අති නවීන යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීම
සාමාන්‍ය තැපැල වෙනුවට දුරකථන, විද්‍යුත් තැපැල
පොත්වල තැබූ ගිණුම් වෙනුවට තොරතුරු පද්ධති භාවිතා කිරීම
මිනිස් ශ්‍රමය වෙනුවට පරිගණක කල සාධක ඇතුළත් පරිසරය
ආ) ව්‍යාපාර කෙරෙහි බලපාන අර්ථික සාධක ඇතුළත් පරිසරය (ල.02)
IV. අ) නවීන තාක්ෂණය ලබාගත හැකි වීම
ගුණාත්මක විදේශිය අමුද්‍රව්‍ය ලබාගත හැකි වීම
කාර්යක්ෂම යන්ත්‍ර සූත්‍ර ලබාගත හැකි වීම
විදේශිය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම
දේශිය භාණ්ඩ හා සේවා සඳහා විදේශ වෙළඳපල ලබාගත හැකි වීම
ආ) දැඩි තරගකාරිත්වයට මුහුණ දීමට සිදු වීම
දේශිය පුහුණු ශ්‍රමය විදේශිය රටවලට ඇදී යාම
දේශිය ව්‍යාපාර වල පැවැත්ම අස්ථාවර වීම
දේශිය සංස්කෘතියේ අයහපත් වෙනස්කම් ඇති වීම (ල.02)

04) I. අ) 1. ව්‍යාපාරයේ ප්‍රාග්ධන ප්‍රමාණය 2. සේවක සංඛ්‍යාව
3. භාවිතා කරන බලශක්ති ප්‍රමාණය 4. ව්‍යාපාරයට ඇති වෙළඳපල කොටස (ල.02)

II. අ) ඔව් අයිතිකරුවන්ගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන නිසා ලියාපදිංචි කිරීම කළ යුතුය.
ආ) 1. වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි වීම
2. හවුල්කරුවන්ගේ විවිධ දක්ෂතා ප්‍රයෝජනයට ගත හැකි වීම
3. වගකීම හවුල්කරුවන් අතර බෙදීයාම
4. සාමූහික තීරණ ගතහැකි වීම (ල.02)
III. අ) සත්‍යයි ආ) සත්‍යයි ඉ) අසත්‍යයි ඊ) අසත්‍යයි (ල.02)

IV. අ) 1. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම 2. ස්වෙච්ඡා හා විවෘත සාමාජිකත්වය
3. සාමාජිකයන්ගේ සාමූහික අයිතිය 4. පොදු අවශ්‍යතා හා අරමුණුවලින් යුක්ත වීම
ආ) 1. තනිපුද්ගල ව්‍යාපාර 2. රාජ්‍ය සංස්ථා (ල.02)

05) I. අ) වත්කම් ආ) වත්කම් ඉ) වියදම් ඊ) ආදායම් (ල.02)

II.

| ගනුදෙනුව | ලී බඩු උපකරණ | + තොගය | + මුදල් | = හිමිකම් | + බැංකු ණය | + ණයහිමියෝ |
|---|---|---|---|---|---|---|
| I | | | +300 000 | | +300 000 | |
| II | +50 000 | | - 50 000 | | | |
| III | | +10 000 | | | | +10 000 |
| IV | | | -25 000 | | | - 25 000 |

(ල.02)


(4) www.PastPapers.WiKi (3)
Download Term Test Papers, Short Notes From One Place!

III. අ) ලී බඩු උපකරණ ගිණුම හර රු.100 000
මුදල් ගිණුම බැර රු.100 000 (ල.02)

ආ) මුදල් ලැබීම - මුදල් පොත , ලදු පත
මුදල් ගෙවීම - මුදල් පොත , ගෙවීම් වවුචරය (ල.02)

IV.

මුදල් ගිණුම

| | | | |
|---|---|---|---|
| 2023.01.01 ප්‍රාග්ධන ගිණුම | 300 000 | 2023.01.02 විදුලි වියදම් | 2 000 |
| 2023.01.05 කුලී ආදායම් ගිණුම | 15 000 | 2023.04.04 බැංකු ණය ගිණුම | 10 000 |

ප්‍රාග්ධන ගිණුම

| | | | |
|---|---|---|---|
| | | 2023.01.01 මුදල් ගිණුම | 300 000 |

විදුලි වියදම් ගිණුම

| | | | |
|---|---|---|---|
| 2023.01.02 මුදල් ගිණුම | 2 000 | | |

බැංකු ණය ගිණුම

| | | | |
|---|---|---|---|
| 2023.01.04 මුදල් ගිණුම | 10 000 | | |

කුලී ආදායම් ගිණුම

| | | | |
|---|---|---|---|
| | | 2023.01.05 මුදල් ගිණුම | 15 000 |

(ල.04)

06) I. වැරදි නිවැරදි කිරීමේ සටහන් , ගැලපුම් සටහන් (ල.02)

II. බැංකු ජංගම ගිණුමේ පවතින ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කළ විට බැංකුව එම චෙක්පත් වලට ගෙවීම් කිරීම නිසා ගිණුම් හිමියා බැංකුවට ණයගැති වන අගය (ල.02)

III. හර මුදල් පොත බැර

| දිනය | ල.අ | විස්තරය | ස.පි | වට්ටම | වටිනාකම | දිනය | ව.අ | විස්තරය | ස.පි | වට්ටම | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2023 4 / 1 | | ශේෂය ඉ.ගේ | | | 75 000 | 4/9 | 41 | ණයහිමි ලිමායා | | 1 500 | 28 500 |
| 4/5 | | ණයගැති මල්මී | | 5 000 | 25 000 | 4/18 | 60 | ණයහිමි දිනිති | | 1 500 | 18 500 |
| 4/12 | | ණයගැති දිව්‍යා | | 2 000 | 18 000 | 4/30 | | ශේෂය ප/ගෙ | | | 71 000 |
| | | | | 7 000 | 118 000 | | | | | 3 000 | 118 000 |
| 5/1 | | ශේෂය ඉ/ගෙ | | | 71 000 | | | | | | |

(ල.04)

| ලැබීම් රු. | ස පි | දිනය | විස්තරය | ව අ | ගෙවීම් රු. | විශ්ලේෂණය තැපැල් | ගමන් | ලෙජර් ගිණුම | ලො පි |
|---|---|---|---|---|---|---|---|---|---|
| 4 000 | | 9/1 | මුදල් පොත | | | | | | |
| | | 9/5 | තැපැල් වියදම් | | 500 | 500 | | | |
| | | 9/15 | ගමන් වියදම | | 500 | | 500 | | |
| | | 9/18 | අත්තිකාරම් රංග | | 1500 | | | 1500 | |
| | | 9/27 | ගමන් වියදම් | | 750 | | 750 | | |
| | | | | | 3250 | 500 | 1250 | 1500 | |
| | | 9/30 | ශේෂය ප/ගෙ | | 750 | ලෙ.පි | ලෙ.පි | ලෙ.පි | |
| 4 000 | | | | | 4 000 | | | | |
| 750 | | 10/1 | ශේෂය ඉ/ගෙ | | | | | | |

(ල.04)

07) I. නිවැරදි ගනුදෙනු දෙකකට ලකුණු දෙන්න (ල.02)

II. ගනුදෙනුවක් සම්පූර්ණයෙන්ම පොත් වලින් මග හැරීම
ගනුදෙනුවක වටිනාකම මූලික පොත් වල වැරදියට සටහන් වීම
එකම ගනුදෙනුව ගිණුම් පොත් වල දෙවරක් සටහන් වීම
කිසියම් ගනුදෙනුවක වටිනාකම නියමිත ගිණුමේ සටහන් නොකර වෙනත් ගිණුමක සටහන් කිරීම(ල.02)

III. ණයගැති ගිණුම හර රු 75 000 බැංකු ගිණුම බැර රු 75 000 (ල.02)

IV. ගැනුම් ජනලය

| දිනය | ඉන් . අ . | සැපයුම්කරු | මුළු වටිනාකම | ලෙ .ගි |
|---|---|---|---|---|
| 10.01 | 20 | පුබුදු | 25 000 | |
| 10.12 | 21 | අමිත් | 50 000 | |
| 10.15 | 22 | සුමිත් | 90 000 | |
| 10.31 | | ගැණුම් ගිණුමට බැර කළා | 165 000 | |

(ල. 4)

ගැණුම් ගිනුම

| දිනය | විස්තරය | | වටිනාකම | දිනය | විස්තරය | | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 10.31 | ණයහිමි ගිණුම | | 165 000 | | | | |

අමිත්

| | |
|---|---|
| | 10/1 ගැණුම් 25 000 |

පුබුදු

| | |
|---|---|
| | 10/12 ගැණුම් 50 000 |

සුමිත්

| | |
|---|---|
| | 10/15 ගැණුම් 90 000 |

(ල.02)



PAST PAPERS WIKI
(4) www.PastPapers.WiKi (4)
Download Term Test Papers, Short Notes From One Place!

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න



ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න